ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

අධ්‍යාපනවේදී (විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ)ගෞරව උපාධි වැඩසටහන 2020/2021

5 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2021

අන්තර්කරණ අධ්‍යාපනය - SNU5242 /ESU3142

කාලය පැය තුනයි. (03)

---

දිනය - 2021.08.08      වේලාව -ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. විශේෂ දරුවන් වර්ග තුනක් (03) දක්වා ඔවුන් විශේෂ ලෙස සලකන්නේ මන්දැයි විස්තර කරන්න.

02. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතියේ බහු සංස්කෘතික අධ්‍යාපනයේ ප්‍රධාන අරමුණු තුනක් (03) විස්තර කරන්න.

03. ඔටිසම් පරාසීය අක්‍රමතාවයේ ප්‍රධාන වර්ග සුදුසු උදාහරණ දක්වමින් කෙටියෙන් පැහැදිලි කරන්න.

04. විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය සහ විශේෂ අධ්‍යාපනය අතර අන්තර් සම්බන්ධතාව අගයන්න.

05. අන්තර්කරණ අධ්‍යාපන පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුලදී කායික ආබාධ සහිත දරුවන් මුහුණ දෙන අභියෝග තුනක් (03) කෙටියෙන් පැහැදිලි කරන්න.

06. සැමට අධ්‍යාපනය සඳහා සමුළුව ශ්‍රී ලංකාවේ අන්තර්කරණ අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම සඳහා කෙතරම් දුරට පහසුකම් සැලසුවේ දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

07. පන්තිකාමරයක හැසිරීම් අක්‍රමතා සහිත දරුවෙක් සඳහා සහය දෙන ගුරුවරියක විසින් සැලකිය යුතු වැදගත් කරුණු පහක් (05) දක්වන්න.

08. සුභග හා සහජ දක්ෂතා ඇති දරුවන් විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති දරුවන් ලෙස සැලකීමට හේතු තුනක් (03) කෙටියෙන් පැහැදිලි කරන්න.

( ලකුණු 05 x 08 = 40)

## 2 වන කොටස

09. (I) ශ්‍රී ලංකාවේ අන්තර්කරණ අධ්‍යාපන සංකල්පය විශේෂ පාසල්වල වෙන්කළ අධ්‍යාපන සංකල්පයට වඩා පහත අංග යටතේ වෙනස් වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

- නවාතැන්
- මානව සම්පත්
- භෞතික සම්පත්
- සමාජානුයෝජන අවස්ථා
- අධ්‍යයන ක්‍රියාවලිය
- තක්සේරුකරණ ක්‍රියාවලිය (ලකුණු 10)

(II) පහත දැක්වෙන අංගයන් සඳහා ශ්‍රී ලංකාවේ පාසල්වල අන්තර්කරණ අධ්‍යාපන ව්‍යවහාරය ප්‍රවර්ධනය කිරීම සඳහා ඔබගේ යෝජනා දක්වන්න.

- නවාතැන්
- මානව සම්පත්
- භෞතික සම්පත්
- සමාජානුයෝජන අවස්ථා
- අධ්‍යයන ක්‍රියාවලිය
- තක්සේරුකරණ ක්‍රියාවලිය (ලකුණු 10)

10. (I) අන්තර්කරණ පන්තිකාමරයක විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන් මුහුණදෙන චිත්තවේගී හා චර්යාත්මක ගැටලු පැහැදිලි කරන්න. (ලකුණු 08)

(II) විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන්ගේ චිත්තවේගී හා චර්යා ගැටලු මඟහරවා ගැනීමට ගුරුවරයෙක් වශයෙන් ඔබට ගතහැකි පියවර මොනවා ද? (ලකුණු 12)

11. (I) "2020 වර්ෂයේ දී විශ්වීය වශයෙන් ළමුන් මිලියන 260 ක් අධ්‍යාපන ප්‍රතිපාදනවලින් සහ පාසලෙන් බැහැරව ඇත."

උදාහරණ දක්වමින් ශ්‍රී ලංකාවේ සැමට අධ්‍යාපනයේ ඉලක්ක සපුරා ගැනීමේ දී විශේෂ අවශ්‍යතා අධ්‍යාපන පද්ධතිය මුහුණ දෙන අභියෝග විස්තර කරන්න. (ලකුණු 10)

(II) විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපන ක්‍රමයේ ප්‍රමුඛ ස්ථානයක් බවට පත්ව ඇත්තේ මෑතකාලීනව ය.

a) ඒ සඳහා මෙතරම් කාලයක් ගතවී ඇත්තේ ඇයි?
b) ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනයේ පාර්ශවකරුවන් අතර මෙම උනන්දුව වැඩිවීමට බලපා ඇති සාධක මොනවා ද? (ලකුණු 10)

12. (I) බුද්ධිමය ඌනතා ඇතිවීමට හේතු තුනක් **(03)** විස්තර කරන්න. (ලකුණු 08)

(II) "බුද්ධිමය ඌනතා සහිත සිසුන්ට ඔවුන්ගේ එදිනෙදා පාසල් වැඩ සඳහා පෞද්ගලික සහයක් අවශ්‍ය වේ."

අන්තර්කරණ පන්තිකාමර ගුරුවරයෙක් ලෙස ඔබට බුද්ධිමය ඌනතා සහිත ශිෂ්‍යයාට උපකාර කළහැකි ආකාරය උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 12)

13. (I) "ශ්‍රී ලංකාවේ සාමාන්‍ය පන්තිකාමර හා පාසල් පරිසරයේ ස්වභාවය විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති සිසුන්ගේ සංවර්ධනයට බාධා ඇති කරයි."

ඉහත ප්‍රකාශය සාධාරණීකරණය කරන්න. (ලකුණු 08)

(II) ඔබේ පන්තිකාමරයේ සහ පාසලේ අන්තර්කරණ මිත්‍රශීලී පරිසරයක් නිර්මාණය කිරීම සඳහා යෝජනා දක්වන්න. (ලකුණු 12)

14 පහත සිද්ධිය කියවා ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

මයුරි හය වසරේ ඉගෙනුම ලබන අතර ඇය පන්ති කාමරයේ ක්‍රියාකාරී ශිෂ්‍යයාවකි. ඇගේ මතකය ඉතා යහපත් වුවද ගණිතය සහ විද්‍යාව ක්‍රියාකාරකම් අතරතුර ඇය ගැටලුවක් විසඳීම සඳහා එක් පියවරකට වඩා වැඩියෙන් භාවිතයේදී දුෂ්කරතාවයට මුහුණ දෙන බව සටහන් වී ඇත. ඇය සමහරවිට එක් පියවරකට වඩා වැඩි ගණනය කිරීම්වල දී දෝෂ ඇති කරයි. ඇයගේ අදහස් තර්කානුකූලව හා අනුක්‍රමිකව පැහැදිලි කිරීමට අපහසු ය.

(I) අන්තර්කරණ පන්තිකාමරයක මයුරි වැනි සිසුන් මුහුණ දෙන ප්‍රධාන දුෂ්කරතා මොනවාද? (ලකුණු 06)

(II) පන්තිකාමරයේ ඇති දුෂ්කරතා මඟහරවා ගැනීමට මයුරිට උදව් කිරීමට ඔබට අනුවර්තනය විය හැකි ක්‍රම පහත අංශ යටතේ පැහැදිලි කරන්න.

- ඉගෙනුම් ඉගැන්වීමේ ක්‍රියාවලිය තුල ඉඩ සැලසීම්
- ඉගෙනුම් ආධාරක
- තක්සේරුකරණයන් (ලකුණු 14)

- හිමිකම් ඇවිරිණි. -